**ශ්‍රී ලංකා ක්‍රිකට් - 2017**

**----------------------------**

ශ්‍රී ලංකා ක්‍රිකට්හි (Sri Lanka Cricket – SLC) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතින් සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සංගමයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විධායක කමිටුවේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ( SLFRS for SMES) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම විධායක කමිටුවේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා ක්‍රිකට්හි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ශ්‍රී ලංකා ක්‍රිකට්හි අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

විධායක කමිටුව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්තවාගණනය මතය සඳහා පදනම

### (අ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS for SMES)

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ උප වගන්ති 3.17 (C) අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්තා කරන ලද කාල පරිච්ඡේදය සඳහා හිමිකම් අරමුදල් වෙනස්වීම්/ ශුද්ධ වත්කම් ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

### (ආ) ගිණුම්කරණ අඩුපාඩු

(i) වටිනාකම රු.2,213,944,841 ක් වූ අනිකුත් ස්ථානීය ණයහිමියන් යටතේ මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම් වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවිය යුතු මුදලක්ද දක්වා තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙම වගකීම තහවුරු කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 28 අනුව මෙම සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා රජය භාරගෙන තිබුණි. මේ අනුව මෙම වගකීමෙහි පැවැත්ම සහ නිවැරදිභාවය පිළිබඳව විගණනයේදී සහතික කළ නොහැකි විය.

(ii) දේශීය ක්‍රීඩාපිටි සහ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගන ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ එකතුව රු.19,046,757 ක අත්තිකාරම් ගෙවීම්,අදාළ ගිණුම්වල ගැලපීමක් සිදුනොකර අත්තිකාරම් ගිණුම්වල වර්ෂ 05 කට අධික කාලයක සිට රඳවා ගෙන තිබුණි.

(iii) 2006 සිට 2014 කාලපරිච්ඡේදයට අදාළව ලැබුණු ක්‍රීඩාපිටි කුලියට දීමේ ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල් රු.1,002,380 ක් නියමිත පරීක්ෂා කිරීම් සිදුකර නිරවුල් කිරීමට හෝ ගිණුම්වලට ගැලපීම් කිරීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස දක්වා තිබුණි.

(iv) 2008 සිට 2017 කාල පරිච්ඡේදය තුළදී ක්‍රීඩා තරඟ සඳහා ක්‍රිකට් සංගම් වෙත ලබා දී තිබුණු රු.58,269,995 ක අත්තිකාරම් නිරවුල් නොකර මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවතුණි. මේ අනුව, ඉහත කාල සීමාවේ මූල්‍ය ප්‍රතිඵලය අදාළ අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(v) රු.13,011,943 ක් වූ ලැබිය යුතු අනුග්‍රාහක ආදායම් උපලබ්ධි නොවූ ආදායම් ලෙස වර්ෂ 5 කට වැඩි කාලයක් පැවති අතර ඒවා අයකර ගැනීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

### (ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත (SEC) රු.258,347,662 ක් ගෙවිය යුතුව තිබුණි. කෙසේ වුවද, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ලද ශේෂ තහවුරු කිරීම් අනුව එය රු.334,368,499 ක් විය. එම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවිය යුතු අගයෙහි විශ්වාසනියත්වය සහ නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සහතික කළ නොහැකි විය.

### (ඈ) විගණනය සඳහා සාක්ෂි නොවීම

(i) පසුගිය වර්ෂ කිහිපයක හා සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනය සහ භෞතික සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) රු.176,750,997 ක් අගය වූ ලැබිය යුතු එකතු කළ අගය මත බදු වලට අදාළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබුණු උපලේඛන සහ ශේෂ සනාථන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) රු.240,986,347 ක් අගය වූ නොනිමි වැඩ වලට අදාළ කොන්ත්‍රාත් ගිවිසුම්, වැඩ භාර ගැනීමේ ලිපි සහ වැඩ ආරම්භ හා අවසන් කළ යුතු දිනයන් යනාදි සම්බන්ධිත ලියවිලි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අගයන්වල නිවැරදිතාවය සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(iv) අනිකුත් අත්තිකාරම් ලෙස ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු 2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.5,845,788 ක් වූ හඳුනා නොගත් ශේෂය 2017 දෙසැම්බර් 31 දිනටත් නිරවුල් නොකර පැවතුණි. එම නිසා, ඉහත හඳුනා නොගත් ශේෂයේ පැවැත්ම හා නිවැරදිතාවය විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ක්‍රිකට්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS for SMES) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට්හි මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.2,128,044,081 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.63,962,186 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,064,081,895 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. ජාත්‍යන්තර ක්‍රිකට් ආදායම රු.2,879,626,868 කින් වැඩිවී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්ය සාධනය

-----------------

ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ (ICC) ශ්‍රේණිගත කිරිමේදී මුළු ආකෘතින් තුනකට අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | ටෙස්ට් ශ්‍රේණිගත කිරීම | එක්දින ජාත්‍යන්තර (ODI) | විස්සයි විස්ස (T 20) |
|---|---|---|---|
| 2017 | 7 | 6 | 8 |
| 2016 | 7 | 5 | 8 |
| 2015 | 7 | 5 | 1 |
| 2014 | 6 | 2 | 1 |
| 2013 | 6 | 6 | 1 |

ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ ශ්‍රේණිගත කිරීම් අනුව පසුගිය වර්ෂ 4 සමග සැසඳීමේදී 2017 වර්ෂයේ ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ කාර්ය සාධනයේ පිරිහීමක් විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

නිලධාරීන් 17 දෙනෙකුගෙන් අයකර ගත යුතුව තිබුණු රු.1,080,825 ක් වූ සේවක ණය ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පිළිබඳව වරින්වර ශ්‍රී ලංකා ක්‍රිකට් සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) අත්තිකාරම් ගෙවීම් | අත්තිකාරම් පාලනය හා අධීක්ෂණය පිරිහීම. |
| (ආ) වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම හා ස්ථාවර වත්කම් සමීක්ෂණය සිදුකිරීමට අපොහොසත් වීම. |
| (ඇ) මූල්‍ය පාලනය | ජංගම ගිණුම් අතර පාලනයකින් තොරව මුදල් හුවමාරු කිරීම |